ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
இலங்கை தகவல் தொலைத்தொடர்பாடல் தொழில்நுட்ப நிறுவனம்
Information & Communication Technology Agency of Sri Lanka
*An Agency under the Presidential Secretariat*

ICTA
*ideas actioned*

මගේ අංකය - Re-Gov/Sin-Uni

2007-08-15

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා යුනිකෝඩ් (Unicode) අක්ෂර භාවිතය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නිකුත් කළ අංක SP/SB/01/07 හා 2007.03.14 දින දරණ චක්‍රලේඛයට හා එයට අදාලව මෙම ආයතනයේ හිටපු සභාපති ඔබ ඇමතූ සමාංක හා 2007.04.04 දින දරණ ලිපියට අමතරවයි.

02. උක්ත චක්‍රලේඛය මගින් රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා අප ආයතනය නිපයූ සිංහල යුනිකෝඩ් මෘදුකාංග භාවිතා කරන ලෙස දන්වා ඇත. එහෙත් සිංහල මෘදුකාංග නිපදවන සමාගම් විසින් ද සිංහල යුනිකෝඩ් හා අනුකූල වන නිපැයුම් අලෙවි කරන අතර ඒවා ද රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා යොදා ගැනීමේ බාධාවක් නැත.

03. සිංහල යුනිකෝඩ් අනුකූලතාව නිශ්චය කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අංක SLS1134:2004 (දෙවන කොටස: පරීක්ෂණ ක්‍රම හා අවශ්‍යතා) දරණ ප්‍රමිතිය නියම කොට ඇත. ඒ අනුව තම නිපැයුම් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ඉදිරිපත් කොට අංක SLS1134:2004 දරණ ප්‍රමිති සහතිකය ලබා ගන්නා ලෙස අප විසින් දැනටමත් සිංහල යුනිකෝඩ් හා අනුකූල මෘදුකාංග නිපදවන්නන් දිරිමත් කර ඇත. එහෙයින් රාජ්‍ය ආයතනවල සිංහලෙන් පරිගණක කටයුතු සඳහා වාණිජ මෘදුකාංග මිළ දී ගන්නේ නම් ඒවායේ සිංහල යුනිකෝඩ් අනුකූලතාව සහතික කරන අංක SLS1134:2004 දරණ ප්‍රමිති සහතිකය සහිත මෘදුකාංග පමණක් මිළ දී ගැනීම ප්‍රඥාගෝචර වේ.

04. අප ආයතනය විසින් නිපදවන ලද සිංහල යුනිකෝඩ් මෘදුකාංග කට්ටලය නොමිලයේ ලබා ගත හැකි අතර එමගින් සපයනුයේ සිංහලෙන් පරිගණක භාවිතා කිරීමේ මූලික අවශ්‍යතා කිහිපයක් පමණි. එහෙත් සිංහල යුනිකෝඩ් අනුකූල වාණිජ නිපැයුම් සිංහලෙන් පරිගණක කටයුතු කිරීමේ පහසුකම්වලට අමතරව නොයෙකුත් අංග මගින් වැඩිපුර අගයන් එකතු කොට ඇත. (උදා - සිංහල අක්ෂර වින්‍යාසය පිරික්සීම, සිංහල ඉංග්‍රීසි වචන පරිවර්තනය, සිංහල පරිගණක යතුරු ලියන පාඩම්).

05. ඒ අනුව ඔබ ආයතනයට අවශ්‍ය සිංහල යුනිකෝඩ් මෘදුකාංගය තෝරා ගැනීමේ දී ඔබ ආයතනයේ සිංහල පරිගණක අවශ්‍යතා මට්ටම අනුව සුදුසු මෘදුකාංගය ලබා ගැනීමට කටයුතු කිරීම මැනවි.

මෙය ජනාධිපති ලේකම්ගේ අනුමැතිය මත ඔබ වෙත එවනු ලැබේ.

මහාචාර්ය පී.ඩබ්ලිව්. ඇපාසිංහ
වැඩ බලන සභාපති

*eSri Lanka*
*smart people smart island*

160/24, කිරිමණ්ඩල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව 160/24, கிரிமண்டல மாவத்தை, கொழும்பு 5, இலங்கை 160/24, Kirimandala Mawatha, Colombo 05, Sri Lanka

දුරකතන : தொலைபேசி: Tele : +94-11-2369099
ෆැක්ස් : தொலை நகல் : Fax : +94-11-2369091
ඊ මේල්: ஈமெயில்: E-mail: info@icta.lk
වෙබ් : இணையம் : Web : www.icta.lk

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
இலங்கை தகவல் தொலைத்தொடர்பாடல் தொழில்நுட்ப நிறுவனம்
Information & Communication Technology Agency of Sri Lanka
*An Agency under the Presidential Secretariat*

ICTA
*ideas actioned*

**My No: Re-Gov/Sin-Uni**

2007-08-15

All Secretaries of Ministries and Heads of Departments,

**Using Unicode Fonts for Computing in Government**

I refer to the Secretary to the President's Circular no; SP/SB/01/07 and to the letter, dated 2007-04-04 on the above subject by our past chairman.

The above circular recommends that the government organizations should use only the Unicode compliant Sinhala software kit produced by ICTA for computing in Sinhala. However government organizations may also use Unicode compliant Sinhala products which have been developed and marketed by other companies in Sri Lanka.

Sri Lanka Standards Institute (SLSI) has published the standard "SLS 1134: 2004 Part 2: *Requirements and Methods of Test*" to verify Sinhala Unicode compliance of Sinhala supporting software. Accordingly, we have encouraged companies which produce various Sinhala based software products to obtain "SLS 1134: 2004 Part 2" certification for their products. This letter provides strong justification to purchase the products, which are certified as conforming to "SLAS 1134:2004 standard" in case you are purchasing commercially available software for computing in Sinhala.

The *Sinhala Unicode kit* produced by ICTA (which is issued free of charge) includes standard Sinhala fonts, keyboard driver and installation instructions, and only facilitates basic computing in Sinhala.

However, commercially available products in the market offer additional options such as Sinhala spell checking facilities, Sinhala to English word translation, Sinhala typing tutors etc. You may choose any of such products depending on your affordability and the level of Sinhala computing needs of your organization.

This letter is issued with the concurrence of Secretary to the President.

**Prof. P.W. Epasinghe**
Acting Chairman

*e Sri Lanka*
*smart people smart island*

160/24, කිරිමණ්ඩල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව 160/24, கிரிமண்டல மாவத்தை, கொழும்பு 5, இலங்கை 160/24, Kirimandala Mawatha, Colombo 05, Sri Lanka

දුරකතන : தொலைபேசி: Tele : +94-11-2369099
ෆැක්ස් : தொலை நகல் : Fax : +94-11-2369091
ඊ මේල්: ஈமெயில்: E-mail: info@icta.lk
වෙබ් : இணையம் : Web : www.icta.lk